# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1807/25 - 2013 අප්‍රේල් මස 26 වැනි සිකුරාදා - 2013.04.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### මහනුවර මහ නගර සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

මිය යාම හේතු කොට ගෙන මහනුවර මහ නගර සභාවේ සභිකයකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

සංජීව හුලංගමුව නම් වූ සභිකයා අයත් වන්නාවූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) කාල පරිච්ඡේදය ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් ඒ මහනුවර මහ නගර සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු වන හේරත් මුදියන්සේලාගේ උපාලි විජිත ජයසේකර මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

මහනුවර මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරී මුදියන්සේලාගේ කුමුදු සමන් ශ්‍රී රත්නායක වන මම, හේරත් මුදියන්සේලාගේ උපාලි විජිත ජයසේකර මහතා මහනුවර මහ නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කරගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

සමන් ශ්‍රී රත්නායක,
තේරීම්භාර නිලධාරි,
මහනුවර මහ නගර සභාව.

2013 අප්‍රේල් මස 19 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මහනුවර.

05 - 302


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 17585— 350 (2013/04)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*